# වාරිමාර්ග දෙපාර්තමේන්තුව
# நீர்ப்பாசனத் திணைக்களம்
# IRRIGATION DEPARTMENT
## (HYDROLOGY DIVISION)


වාරිමාර්ග අධ්‍යක්ෂ / நீர்ப்பாசனத பணிப்பாளர் / Director of Irrigation } 011-2581636

ෆැක්ස් / பக்ஸ் / Fax } 011-2591125

ලිපිනය / முகவரி / Address } 230, තැ.පෙ. 1138, බෞද්ධාලෝක මාවත, කොළඹ07. / 230, த.பெ.1138,பௌத்தாலோக்கமாவத்தை, கொழும்பு 07,இலங்கை / 230, P.O. Box 1138, Bauddhaloka Mawatha, Colombo 07.

දුරකථනය (පොදු) / தொலைபேசி (பொது) / Telephone (General) } 011-2590145

විද්‍යුත් ලිපිනය / ஈ.மெய்ல் முகவரி / E-mail Address } ddhydrology@gmail.com

වෙබ් අඩවිය / இணையதளம் / Web site } www.irrigation.gov.lk


මගේ අංකය / எனது இல / My No. } HYG/W/103(v)

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திக / Date } 2021.07.12

**ගංවතුර අනතුරු ඇඟවීම් ඉවත් කිරීමේ නිවේදනය**

2021.07.12 වන දින ප.ව. 1.00ට නිකුත් කරන ලදී.

**<u>ගංවතුර අනතුරු ඇඟවීම ඉවත් කිරීම.</u>**

01. පසුගිය පැය 48 තුළ දිවයිනේ කිසිදු ප්‍රදේශයකින් සැලකිය යුතු වර්ෂාපතනයක් වාර්තා නොවීම නිසාත්, ඉදිරි දින සඳහා වූ කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කාළගුණ අනාවැකි මගින් සැලකිය යුතු මට්ටමේ ඉහළ වර්ෂාපතනයක් පිළිබඳ අනතුරු ඇඟවීමක් නොමැති නිසාත්, පසුගිය දිනවල දිවයිනේ නිරිත දිග ප්‍රදේශයේ ගංගාවලින් වාර්තා වූ තරමක් ඉහල ජල මට්ටම් මේ වන විට සැලකිය යුතු ලෙස පහල යමින් පවතින නිසාත් එම ගංගාවල ගංවතුර සම්බන්ධයෙන් වූ අවදානම් සහගත තත්ත්වය මේ වන විට පහව යමින් පවතී.

02. ඒ අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ අංශය මගින් නිකුත් කරන ලද පහත සඳහන් පූර්ව ගංවතුර අනතුරු ඇඟවීම් නිවේදන මගින් සිදු කරන ලද අනතුරු ඇඟවීම් මෙමගින් ඉවත් කරනු ලැබේ.

    i. 2021.07.10 දින පෙ.ව. 2.00 ට කළු ගංගා ද්‍රෝණිය සඳහා නිකුත් කරන ලද නිවේදන - අංක 01
    ii. 2021.07.10 දින පෙ.ව. 3.30 ට කැළණි ගංගා ද්‍රෝණිය සඳහා නිකුත් කරන ලද නිවේදන - අංක 01
    iii. 2021.07.10 දින පෙ.ව. 4.00 ට ගිං ගංගා ද්‍රෝණිය සඳහා නිකුත් කරන ලද නිවේදන - අංක 01
    iv. 2021.07.10 දින පෙ.ව. 4.00 ට නිල්වලා ගංගා ද්‍රෝණිය සඳහා නිකුත් කරන ලද නිවේදන - අංක 01

03. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුවේ ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ අංශය විසින් පවත්වාගෙන ආ ගංවතුර පුරෝකථන මැදිරියේ රාත්‍රී මෙහෙයුම් කටයුතු අද දින පස්වරු 3.30 සිට නතර කරන නමුත් දිවයිනේ සියළුම ගංගාවල ජලමට්ටම් නිරීක්ෂණය මෙම අංශය විසින් සාමාන්‍ය පරිදි අඛණ්ඩව කරගෙන යනු ලැබේ. එළඹෙන තත්ත්වයන් පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තුව නිරන්තර විමසිල්ලෙන් පසුවන අතර, ගංගාවල ජලමට්ටම් ඉහල යාම සම්බන්ධයෙන් සුදුසු පරිදි කල්වේලා ඇතිව දැනුම්වත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ඉංජි. එස්.පී.සී. සුගීශ්වර
වාරිමාර්ග අධ්‍යක්ෂ
ජල විද්‍යා හා ආපදා කළමනාකරණ
මාර්ග දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත.

ඉංජි. එස්.පී.සී.සුගීශ්වර

වාරිමාර්ග අධ්‍යක්ෂ (ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ)